කතාව පමණයි. යුද්ධය ගැන අත්දැකීම් නොතිබුණු නිසා එය නාට්‍ය තුළ ගොඩ නැගී තිබුණේ නැහැ. නමුත් අපි නිෂ්පාදනය කරන කොට අපිට යුද්ධය පිළිබඳ ඕනෑතරම් අත්දැකීම් තිබුණා. ඒවා අරගෙන වෙනම නිෂ්පාදනයක් ලෙසයි අපි කළේ. යාපනේ ගිහින් කරනකොට තවත් මෙහි අවශ්‍යතාව දැඩි වුණා. නාට්‍යයට සම්බන්ධ දෙමළ තරුණ තරුණියන්ගේ අත්දැකීම් ඉතා ප්‍රබල ලෙස නාට්‍යයට අදාල වුණා. අපි යාපනේදි නාට්‍ය වැඩමුළු මාලාවක් පැවැත්වුවා. ඒවායින් 16 දෙනෙකු තෝරාගෙන ඒ අය ජන කරළියට සම්බන්ධ කළා. නාට්‍යයේ ඇතුළත් දෑ සමාජයට කොයිතරම් අදාළ වනවද කියන එක ඒ අය සමඟ සාකච්ඡා කරමිනුයි දෙමළ පරිවර්ථනය නිෂ්පාදනය කළා.

**කොහොමද එයට ලැබුණු ප්‍රතිචාර ?**
මේ අවුරුද්දේ ජූලි මාසේ ඉඳලා තමයි හුණුවටයේ නාට්‍යය දෙමළ පරිවර්ථනය වේදිකාගත කෙරෙන්නේ. ඉස්සෙල්ලාම යාපනේ වීරසිංහම් ශාලාවේ පෙන්නුවා ජූලි 23වෙනිදා. පසුව කොළඹ සහ රුහුණු විශ්වවිද්‍යාලවල පෙන්නුවා. පසුව මඩකලපුව වවුනියාව කිලිනොච්චිවල රඟ දැක්වුවා. හොඳ ප්‍රතිචාරයක් තිබුණා. මම හිතන්නේ මෑතකදී විචාර ලිපි වැඩිම ප්‍රමාණයක් ලියැවුණු නාට්‍යයක්.

**බ්‍රෙස්ට්ගේ නාට්‍යයෙන් මූලිකව මතු කළේ යුද්ධය පිළිබඳ කාරණයක්ද ? යුක්තිය පිළිබඳ කාරණයක්ද ?**
යුක්තිය පිළිබඳ කාරණාවකට වැඩිය එතන තියෙන්නේ මනුෂ්‍යත්වය පිළිබඳ කාරණයයි. එක තේමාවක් තුළ සිද්ධි ගණනාවක් සහ අර්ථ දැක්වීම් ගණාවක් මතුවිය හැකියි. මෙතනදි මතු කෙරෙන්නේ මහ පොළොවේ අයිතිය. එයට උපමාවක් විදිහට තමයි දරුවාගේ අයිතිය පිළිබඳ සිදුවීම ඇතුළත් වෙන්නේ. දෙවෙනි ලෝක යුද්දෙ කාලේ කෝකේසියාවේ අසර්බයිජාන් ජෝජියා කියන කඳු ආශ්‍රිත ප්‍රදේශය ජර්මන් හමුදාව ආක්‍රමනය කරනවා. ඔවුන් පලවා හරින්න සමීපව තිබුණු ගොවිපලවල් දෙකක ගොවියො තුවක්කු අරගෙන යුද්ධයට යනවා. පළතුරු ගොවිපලක් සහ යාබද සත්ත්ව ගොවිපලක්. යුද්ධයෙන් මේ ගොවිපලවල් දෙකම විනාශ වෙනවා. ගොවිපලේ සතුන් ටික එම ගොවිපලේ ගොවියෝ ඈත වෙනත් ප්‍රදේශයකට අරගෙන යනවා. යුද්ධය ඉවරවෙලා නාසි හමුදා පලවා හැරියට පස්සේ ආපසු එම සතුන් ගේන්න සාකච්ඡා පවත්වන මොහොතේ ආණ්ඩුවේ කෘෂිකර්මයට සම්බන්ධ නිලධාරින් කියනවා සත්ත්ව ගොවිපල තිබුණු තැන වඩා සුදුසු වන්නේ පලතුරු වගාවට කියලා. ඒ නිසා සත්ත්ව ගොවිපලට අයත්ව තිබුණු ඉඩමත් පලතුරු ගොවිපලට අරගන්න හදනවා. සත්ත්ව ගොවිපලේ අය මේකට විරුද්ධ වෙනවා. ප්‍රශ්නයක් මතුවෙනවා. සත්ත්ව ගොවිපල ගෙනයන්න සුදුසු තව තැනක් ඒ මිටියාවත ආශ්‍රිතව තිබෙනවා. නමුත් එතනට යන්න බෑ කියා සත්ත්ව ගොවිපලේ අය කියනවා. එවිට තර්කයක් මතුවෙනවා සත්ත්ව ගොවිපල තිබුණු තැන පස වඩා සුදුසු පලතුරු වගාවට නම් රටේ දියුණුවක් සිදුවෙන්න සුදුසු දේ සුදුසු අයට අයිති වෙන්න ඕනේ කියලා. සත්ත්ව ගොවිපලේ වයසක අය එයට කැමැති වෙන්නේ නැහැ. එහෙත් අන්තිමේ සත්ත්ව ගොවිපල වෙනත් තැනකට ගෙනයාම එයට සිදුවෙනවා. මේ දෙගොල්ල අතර මතභේදය සමතයකට පත් කරන්න පෙන්වන නාට්‍ය තමයි හුණුවටයේ කතාව. එහි භූමියේ අයිතිය සුදුස්සාට ලැබිය යුතුයි කියන එකට උපමාවක් විදිහටයි මව සහ දරුවාගේ කතාව ගෙන එන්නේ. යුක්ති ධර්මය කියන එක මතුවෙන්නේ මේ භූමිය සම්බන්ධ කාරණයත් එක්කයි.

ඒකත් එක්ක සම්බන්ධ වෙනවා මානව යුක්තිය, නීතිය, නීතිය කාටද? කියන කාරණා එහිදී මතුවෙනවා. එක් අවස්ථාවක කිසි වැඩක් පලක් නොකර ගෙදරට වෙලා දවල් වෙනකන් නිදාගෙන සිටින පොහොසත් ගොවියාගේ දියණිය ගැන හැඟීමක් ඇතිවෙලා ගොවිපලේ අශ්වයෝ බලාගන්න තරුණයා ඒ තරුණියට බලහත්කාරකමක් කරනවානේ. ඒකෙදි අසඩක්ගේ නීතිය සළකා බලන්නේ රටේ නීතිය සාධාරණ වන්න නම් සමාජයත් ඒ විදිහට හැඩ ගැහෙන්න ඕනේ කියන එක. ඒක කොමියුනිස්ට් සමාජය. මේවා තමයි මතු කරන්නේ. එහෙම නැතිව ධනේශ්වර පන්තිය විසින් සමාජයට හඳුන්වා දුන් පොතේ තියන නීතිය නෙවෙයි.

**මනුෂ්‍යත්වය, සමානාත්මතාවය, සංහිඳියාව ආදී කරුණුවලදී වර්තමානයේදී කලාකරුවන්ගේ දායකත්වය කෙබඳුද ?**
මම නම් කළකිරිලා ඉන්නේ අපේ රටේ කලාකාරයෝ ගැන. ශත පහක වැඩක් නෑ. තමුන්ගේ වැඩේ කරගෙන අනිත් අයට කතන්දර කියන ජාතියක්. 2010 නොවැම්බර් එකේ ජන කරළිය කරද්දි කට්ටිය තාප්පෙට උඩින් බල බල ජෝන් ද සිල්වා එකේ නාට්‍ය බලන්න යනවා. ඔතනට ආවේ නැහැ. කොළඹ ගිය මාසේ කළ නාට්‍ය උළෙලේදි කලා ක්ෂේත්‍රයේ එක්දාස් ගාණකට විතර අපි ආරාධනා යැව්වා. කවුරුත් ආවේ නෑ. අලුත් ළමයි තමයි ආවේ. ඒ තරම් කුහක ක්ෂේත්‍රයක් මේ රටේ කලා ක්ෂේත්‍රය. හරිම පටු පරමාර්ථයන් තියන කලාකාරයෝ ඉන්න රටක් මේක. හරිම ජාතිවාදියි.

**ඔබ දකින විදිහට ඇයි එහෙම වෙන්නේ ?**
අපේ රටේ මුල් කාලේ, ඒ කියන්නේ විසිවෙනි ශත වර්ෂය ආරම්භයේ ඉඳලා නාට්‍ය කලාව, සංගීතය, චිත්‍රපටි කලාව වර්ධනය වුණේ සිංහල-දෙමළ-මුස්ලිම් කලාකරුවන්ගේ එකමුතුවෙන්. නිර්මාණ කළේ ඒ අය එකට. අපිට මුලින්ම සංගීත කලාවක් තිබුණේ නැහැ. ජන සංගීතයනේ තිබුණේ. පසුව සිංහල සංගීතය ගොඩනගන්නේ සිංහල දෙමළ මුස්ලිම් සංගීත ශිල්පීන්ගේ එකමුතුවෙන්. හුගාක් සිංහල ගී ගායනා කළේ දෙමළ අය. නට්‍ය කලාවත් එහෙමයි. ජෝන් ද සිල්වාගේ නාට්‍ය කණ්ඩායමේ හුගාක් දෙමළ අය හිටියා. සිංහල ශිල්පීන්ගේ සහයෝගයත් තිබුණා. චිත්‍රපටි කලාව ගත්තොත් අපේ චිත්‍රපටි කලාව ගොඩනැගුණෙම දකුණු ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ නිෂ්පාදකවරු, ඒ වගේම සිනමා කර්මාන්තයේ නියැළුණු අය ලංකාවේ චිත්‍රාගාර හදලා සිංහල අය සමග එක්ව වැඩකළා. එදා ඔවුන්ගේ ඒ මැදිහත්වීම නොවුණා නම් සිංහල චිත්‍රපටි කලාවේ ආරම්භයක් සිදු නොවෙන්නත් තිබුණා.

1940 ගණන්වල ලංකාවේ නිදහස දිනාගත් කාලයේ පටන් මේ තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් නැතිවී යන්න ගත්තා. නිදහස දිනාගැනීමෙන් පසුව සිංහල දෙමළ දේශපාලන සමාජයේ ඇතිවූ පිල් බෙදීම් සහ අර්බුදය ඊට බලපෑවා. ඊට පසුව සිංහල පමණක් රාජ්‍ය භාෂාව වීමේ ප්‍රශ්නය ආවා. 56,77,83 ආදි කාලවල සිදුවූ සිද්ධි නිසා සිංහල දෙමළ සමාජයේ ඇතිවූ බරපතල බෙදීම කලාකරුවන් අතරටත් ආවා. දෙපාර්ශවයේ කලින් තිබුණු එකට වැඩ කිරීමේ පුරුද්ද නැතිවෙලා ගියා. සිංහල කලාකරුවෝ සිංහල ප්‍රජාවට පමණක් නිර්මාණ කරන්නත් දෙමළ කලාකරුවෝ දෙමළ ප්‍රජාවට පමණක් නිර්මාණ කරන්නත් පටන් ගන්නවා. අද වෙනකොට කලාකරුවන් ජාතිවාදීන්වීම දක්වාම ඒ ගමන ඇවිල්ලා තියනවා.



සංහිඳියාව වෙනුවෙන් කටයුතු කරන කලාකරුවන් සීමිත පිරිසකුත් ඒ අතර සිටිනවා නේද? ඔබ වැනි.
ඉස්සර කලාකරුවන් එකතුවෙලා වැඩ කළේ ජාතික සමගිය ඇති කරන්න සංහිඳියාව ඇති කරන්න කියලා නෙවෙයි. නමුත් 83න් පසුව එය ආයාශයෙන් ගොඩනගා ගන්න තත්ත්වයකට පත්වුණා. ඒ ගැන හුගාක් අය කල්පනා කළේ නැහැ. නමුත් කලාකරුවෙක් විදිහට මම ඒ ගැන ප්‍රයත්නයක් දැරුවා.

77න් පසුව දෙමළ ජනතාවට එල්ල වූ ප්‍රහාරයෙන් පසුව ජාතීන් අතර යුක්තිය සහ සමානාත්මතාව පිළිබඳ ව්‍යාපාරය නමින් ව්‍යාපාරයක් ගොඩනැගුවා. වාමාංශික වෘත්තීය සමිති, වාමාංශික පක්ෂ, නිදහස් මතධාරීන් ඇතුළු වර්ගවාදයට එරෙහි පිරිස් මෙහි කොටස්කරුවන් වුණා. එහි පාලක මණ්ඩලයේ මමත් හිටියා. මමත් එච්.ඒ. පෙරේරාත් අලුත් විදි නාට්‍ය කණ්ඩායමක් නිර්මාණය කළා. එයට දෙමළ ශිල්පීන් බඳවා ගන්න ලොකු වුවමනාවක් තිබුණා මට. නමුත් ඒ කාලේ මම සිංහල ප්‍රජාව අතරවත් එතරම් ජනප්‍රිය නැහැ. දෙමළ ප්‍රජාව අතරේ කොහොමටවත් නැහැ. ඒ නිසා දෙමළ තරුණ තරුණියන් මේ නාට්‍ය කණ්ඩායමට සම්බන්ධ වීමට ඉදිරිපත් වුණේ නැහැ. කලාව තුළින් තමයි සමාජයක සුඛ දුක්ඛ වේදනාවන් ප්‍රකාශ වන්නේ. නමුත් සිංහල ජනවර්ගය වෙනුවෙන් කරන නිර්මාණ දෙමළ සමාජයට රසවිඳින්න නොලැබෙන නිසා, භාෂා ගැටළුව නිසා මේ ජනවර්ග දෙකම එකම විදිහේ ප්‍රශ්නවලට නේද මැදිවෙලා ඉන්නේ කියන එක තේරුම් ගන්න බැරිවෙනවා. එකිනෙකාගේ හැඟීම් තේරුම් ගන්න බැරි ලොකු පරතරයක් කලාව විසිනුත් නිර්මාණය කරනවා.

**ඔබ කාලයක් ටෙලි නාට්‍ය මගිනුත් සංහිඳියාව වෙනුවෙන් යම් දායකත්වයක් සැපයුවා. ඇයි දැන් එවැනි නිර්මාණ නොකරන්නේ ?**
1982 රූපවාහිනියට බැඳුනට පස්සේ ''යසෝරාවය'', ''ළාහිරු දහසක්'' වැනි ටෙලි නාට්‍යවලදී මම උත්සාහ කළා සිංහල චරිත සමග, පවුල් සමග සම්බන්ධ වෙන දෙමළ චරිත සම්බන්ධ කරගනිමින් ඒ දේ කරන්න. එලෙස නිර්මාණ කීපයක් කළා. නමුත් 83 ජූලි සිදුවූ ඛේදවාචකත් එක්ක ඒක ඉදිරියට කරගෙන යන්න නොහැකි වුණා.
පසුව මෙය හරියටම කරන්න ලැබෙන්නේ 2003 ''ජන කරළිය'' ආරම්භ වීමත් එක්කයි. එච්.ඒ. පෙරේරා සහෝදර කලාකරුවන් එකකයි කළේ. එතනදි අපි පුවත්පත් මගින් දැන්වීම් පලකළා වෘත්තීය නාට්‍ය කණ්ඩායමකට කට්ටිය බඳවා ගන්නවා කියලා. අයදුම්පත් එක්දාස් ගාණක් ලැබුණා. දෙමළ තරුණයෝ පස්දෙනෙක් අයදුම් කරලා තිබුණා. සිංහල අය එකොළොස් දෙනෙක් තෝරාගෙන පසුව දෙමළ අය තෝරාගන්න අපි හිතවතුන් මාර්ගයෙන් වවුනියා, යාපනය, බඟවන්තලාව ප්‍රදේශවලට ගියා. ගෙවල්වලට ගිහිල්ලා දෙමව්පියන් හමුවෙලා මුලින්ම නව දෙනෙක් තෝරාගත්තා. ඔය විදිහට ලංකාවේ විවිධ ප්‍රදේශවලින් තෝරාගත් අය එක වහලක් යට මාස තුනක් රඳවලා උදේ හයේ ඉඳලා රාත්‍රී දහය විතර වෙන තුරු පුහුණු කිරීම් කළා. ඒක දැඩි පුහුණුවක්. ඉන් පසුව තමයි පළවෙනි නාට්‍ය අන්දරමල් නිර්මාණය කළේ. සිංහල දෙමළ භාෂා දෙකෙන්ම එය නිෂ්පාදනය කළා. සිංහල අයත් දෙමළ අයත් එකට නිර්මාණ කටයුතු කළා. ඒ නිසා දෙගොල්ලන්ටම භාෂා දෙකම ඉගෙන ගන්න අවස්ථාව ලැබුණා. අද වෙනකොට අවශ්‍යවෙලා තියන සමාජ ඒකාබද්ධතාවය නාට්‍ය කලාවෙ උපයෝගී කරගෙන ප්‍රවර්ධනය කරන්නේ කොහොමද කියන එකට හොඳ නිදර්ශනයක් ජනකරළියෙන් සපයලා තියනවා. කතන්දර රාශියක් තියනවා. ඉදිරියේදී මේවා ප්‍රදර්ශනය කරන්න බලාපොරොත්තු වෙනවා.

**සංහිඳියාව වෙනුවෙන් ක්‍රියාත්මක වෘත්තීය නාට්‍ය කණ්ඩායමක් ලෙස ජන කරළියේ අනාගත පැවැත්ම සහ රජයෙන් ලැබෙන සහයෝගය ?**
සංහිඳියාව ඇති කරන්න රාජ්‍ය ආයතන පිහිටුවලා තිබුණාට ඒවයින් අපිට කිසිවක් ලැබුණේ නෑ. අපි කරන වැඩේ කවුරුත් තේරුම් අරගෙන නෑ. අපි කොහොමත් බලන්නේ ස්වාධීනව මේක කරගෙන යන්න. අපිට දැන් මුදල් සම්බන්ධ අභියෝගයක් තියනවා.

**යුද්ධයේ සහ සංහිඳියාවේ වෙනස ජනතාවට සන්නිවේදනය කිරීමේදී වේදිකාවට වැඩිය සිනමාව ප්‍රබල මෙවළමක් නොවෙයිද ? සම්මානනීය චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකුද වන ඔබ ඒ මාධ්‍ය මේ සඳහා යොදා නොගන්නේ ඇයි?**
චිත්‍රපටිය සජීවී නැහැ. සජීවී කලාවකට ඊට වැඩිය දෙයක් කළ හැකියි. චිත්‍රපටියක් පෙන්නලා සාකච්ඡා කරන එකට වැඩිය නාට්‍යය කණ්ඩායමක් ගිහින් ඒ ගැන සංවාදයක් කරන එක ප්‍රබලයි. ඉස්සර චිත්‍රපටි ගැන සංවාද තිබුණේ රසික සංවිධාන මගින්. දැන් එහෙම සංවිධාන ඇත්තෙත් නෑ. තිබුණත් කරන්න කට්ටියකුත් නෑ. එකට වැඩ කිරීමෙනුයි මතයක් සමාජගත කරන්න පුලුවන් වෙන්නේ. එල්ටීටීඊ එකේ හිටපු කොල්ලෝ හතර දෙනෙක් ජන කරළියේ ඉන්නවා. ඒ අය කියන්නේ අපිට යුද්ධයක් ඕනේ නෑ. කතා කලොත් උන්ව මරන්න හිතෙනවා කියලා. එකට වැඩකරනකොට තමයි ඒ විදිහට ආකල්ප වෙනස් වෙන්නේ.

ACCOUNTING TUTORING
VCE/TAFE/UNI
- Individual classes
- Small group classes
- Any accounting subject
- Flexible time and home visits
- Reasonable rates
- Based in Dandenong

*Popular tutor and former government school teacher in Sri Lanka.*

Rushan Silva
MBA/MPA (Deakin)
B.Sc (B.Adm) sp.

Contact : 0430297807 E-mail : maths4kids@outlook.com